පූර්ව පිටපත

ජුනි 28 2016

මානව අයිතිවාසිකම් මණ්ඩලය

තිස්දෙවැනි සැසිය.

න්‍යාය පත්‍ර අංක 2

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් ගේ වාර්ෂික වාර්තාව සහ

මහ ලේකම්ගේ සහ මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තා

## ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය.

ලැබුණ ආකාරයට ඉදිරිපත් කෙරේ.

1. මෙම වාචික යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කරන්නේ ශ්‍රී ලංකාවේ සම අනුග්‍රාහකත්වය ඇතිව ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ඒකච්ඡන්දයෙන් සම්මත වූ මානව අයිතිවාසිකම් කවුන්සලයේ 30/1 යෝජනාව ප්‍රකාරවය. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයෙන් (OHCHR ) සිදු කරන ලද සවිස්තරාත්මක විමර්ශනයේ සොයා ගැනීම් සහ නිගමන සහ එහි ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාණ්ඩුව දිරිමත් කිරීම මානව අයිතිවාසිකම් කවුන්සලයේ 30 වැනි සැසියට මහ කොමසාරිස් ඉදිරිපත් කළ වාර්තාව අගය කරන බව සඳහන් කළ යුතුය. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස්ගේ විමර්ශනයේ සිංහල සහ දෙමළ පිටපත් දැන් මෙම වෙබ් අඩවියෙන් ලබා ගත හැකියඃ

http://www.ohchr.org/EN/Countries/AsiaRegion/Pages/LKIndex.aspx

තම නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතියත්, ප්‍රතිසන්ධානය, වගවීම, සහ මානව අයිතිවාසිකම්වලට අදාල අනෙකුත් ක්‍රියාවලීන් පිළිබඳ ප්‍රගතිය නොකඩවා ඇගයීමටත් මානව අයිතිවාසිකම් කවුන්සලයේ තිස්දෙවැනි සැසියට මෙම වාචික යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කිරීමටත් මානව අයිතිවාසිකම් කවුන්සලය මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ ඉල්ලා සිටින ලදී.

2. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශනය මත පදනම් වූ මහ කොමසාරිස්ගේ වාර්තාවෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශ ඉදිරියට ගෙන යමින් ශ්‍රී ලංකාවේ වගවීම සහ ප්‍රතිසන්ධානයේ ප්‍රගමනයට මෙන්ම මානව අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට අවශ්‍ය අධිකරණ සහ අධිකරණ නොවන පියවර ඇතුළත් සවිස්තරාත්මක යෝජනාවලියක් 30/1 යෝජනාවෙන් ඉදිරිපත් කරයි. මෙම යෝජනාවෙන් ශ්‍රී ලංකාණ්ඩුව අන්තර්ජාතික ප්‍රජාවට ලබා දුන් ඓතිහාසික බැඳීම පමණක් නොව වඩාත් වැදගත්ව අතීතයට මුහුණ දීමට සහ දශක ගණනාවක් පැවති දඬුවම් නොලැබ සිටීමේ ජරාජීර්ණ වූ ප්‍රතිපත්තිය අවසන් කිරීමටත්, යුක්තිය ඉටු කිරීමට, ප්‍රතිසන්ධානය සාක්ෂාත් කිරීමට සහ අනාගතයේ දී නැවත ප්‍රචණ්ඩත්වය ඇතිවීම වැළැක්වීම සඳහා සියල්ලන් ඇතුළත් කර ගන්නා ආයතන ගොඩ නැගීමට ඇති කැපවීමත් මෙම යෝජනාවෙන් ඉදිරිපත් කෙරේ. ජනාධිපති සිරිසේන 2016 පෙබරවාරි 4 වැනි දා සිය නිදහස් දින කතාවේ දි ව්‍යක්ත ලෙස දැක් වූ ආකාරයට ''මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් තහවුරු වන්නේ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රතිසන්ධානය යි.''[1]

3. එමනිසා 30/1 යෝජනාව සම්මත කර ගැනීමෙන් මාස නමයකට පසුව සහ ජාතික ආණ්ඩුව පිහිටුවා මාස දහ අටක් ගතවීමෙන් පසුව ශ්‍රී ලංකාව මෙම එකඟතා ක්‍රියාත්මක කිරීමේ දී අත් කර ගත් ප්‍රගතියත්, අභියෝග සහ බාධා හැඳින ගැනීමටත්, මානව අයිතිවාසිකම් කවුන්සලයට මෙම ක්‍රියාවලියේ දී දිගටම සහාය විය හැකි වන්නේ කෙසේද යන්න ඇතුළත්ව ඉදිරියට යෑම සඳහා වූ උපාය මාර්ග නිර්දේශ කිරීමට සුදුසු කාලයයි.

4. මෙම වාචික යාවත්කාලීන කිරීම්වලට බෙහෙවින් පාදක වන්නේ මහ කොමසාරිස් 2016 පෙබරවාරි 6 – 10 දක්වා ශ්‍රී ලංකවේ කළ සංචාරයයි[2]. සිය සංචාරය මුළුල්ලේම ආණ්ඩුව ලබා දුන් සහයෝගය ගැන මහ කොමසාරිස් සිය ස්තුතිය නැවත පුද කරන්නේය. ඔහුට ජනාධිපති සිරිසේන, අගමැති වික්‍රමසිංහ, විපක්ෂ නායක සම්බන්දන්, විදේශ ඇමති සමරවීර සහ තවත් ඇමතිවරුන් මෙන්ම සන්නද්ධ සේවා ප්‍රධානීන් ද හමුවීමට අවස්ථාව ලැබිණ. මහ කොමසාරිස් යාපනය, ත්‍රිකුණාමලය සහ මහනුවරට ගිය අතර එහි දී

[1] http://www.president.gov.lk/news/speech-delivered-by-president-maithripala-sirisena-at-the-68th-independence-day-celebrations-on-february-4-2016
[2] http://www.ohchr.org/EN/NewsEvents/Pages/Display/news.aspx?NewsID=17025&LangID=E

පළාත් මහ ඇමතිවරුන් සහ නිලධාරීන්, ආගමික නායකයන් සහ වින්දිතයන් සහ සිවිල් සමාජ නියෝජිතයන්ගේ පුළුල් පරාශයක් මුණ ගැසුණේය.

5. මෙම යාවත්කාලින කිරීම් පසුගිය මාසවල ශ්‍රී ලංකාවට පැමිණි විශේෂ ක්‍රියාපටිපාටි මැන්ඩේට් බලධාරීන් කීප දෙනෙකු ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සහ නිර්දේශවලින් ද පෝෂණය විය. ශ්‍රී ලංකාව 2015 දෙසැම්බර් මස සියලුම විශේෂ ක්‍රියාපටිපාටින්ට නිකුත් කරන ලද ස්ථාවර ආරාධනය ඇතුළත්ව, ශ්‍රී ලංකාණ්ඩුව එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ සමග ඉතාමත් සාධනීය සහ ඵලදායී සම්බන්ධතා පැවැත්වීම ගැන මහ කොමසාරිස් සිය සතුට පළ කරන්නේය. බලහත්කාරයෙන් සහ කැමැත්තෙන් තොරව අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරි කණ්ඩායම 2015 නොවැම්බර් මස රට තුළ පූර්ණ සංචාරයක් කළහ[3]. සත්‍යය, යුක්තිය, හානිපූරණය සහ නැවත සිදුනොවීම සහතික කිරීම පිළිබඳ විශේෂ සම්බන්ධීකාරක ශ්‍රී ලංකවේ බලධාරීන් සහ සිවිල් සමාජය සමග දිගටම සමීප සම්බන්ධතා පවත්වන අතර පිළිවෙළින් 2016 ජනවාරි සහ ජුනි මාසවල ඔහුගේ දෙවැනි සහ තෙවැනි තාක්ෂණික සංචාර සිදු කරනු ඇත.[4] වධ හිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික සහ අවමන් සහගත සැලකිම් හෝ දඬුවම් පිළිබඳ විශේෂ සම්බන්ධීකාරකවරු සහ විනිශ්චයකරුවන්ගේ සහ නීතිඥයන්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ සම්බන්ධීකාරක මෑතකදී 2016 අප්‍රේල් – මැයි වලදී ඒකාබද්ධ නිල සංචාරයක් නිම කළහ[5]. සුළුතරයේ ගැටලු පිළිබඳ විශේෂ සම්බන්ධීකාරක 2016 ඔක්තෝබර් මස පැමිණීමට නියමිත අතර අදහස් දැරීමේ සහ ප්‍රකාශන නිදහස පිළිබඳ සම්බන්ධීකාරකට 2017 මුල් භාගයේ සංචාරයකට ආරාධනය කර ඇත. ශ්‍රී ලංකාව 2016 මැයි 25 දින සියලු පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් වැළැක්වීමේ ජාත්‍යන්තර සන්ධානය අපරානුමත කිරීම ගැන ද මහ කොමසාරිස් සිය සතුට පළ කරයි. ඉදිරි මාස වලදී ශ්‍රී ලංකාව තම ගිවිසුම්ගත වගකීම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මානව අයිතිවාසිකම් ගිවිසුම් ආයතන ගණනාවක් විසින් පුනරීක්ෂණය කරනු ඇත[6]. ශ්‍රී ලංකාව 2017 ඔක්තෝබර් - නොවැම්බර් හි දී විශ්ව කාලින පුනරීක්ෂණ ක්‍රියාකාරි කණ්ඩායමේ 28 වැනි සැසියේ දීද පුනරීක්ෂණයට ලක් වනු ඇත. ආණ්ඩුව 2016 ජුනි 21 වැනි දා මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයට තොරතුරු ලබා දුන් අතර ඒවා මෙම වාචික යාවත්කාලින ඉදිරිපත් කිරීම සකස් කිරීමේ දී සැලකිල්ලට ගන්නා ලදී.

6. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය රට තුළ රැඳී සිටීමෙන් සහ එහි මූලස්ථානයේ විශේෂඥයන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දූත මෙහෙයන් හි යෙදවීමෙන් ආණ්ඩුවට ක්ෂේත්‍ර ගණනාවක තාක්ෂණ සහාය දිගටම ලබා දේ. ඊට ජාතික උපදේශන යාන්ත්‍රණ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ සංක්‍රාමීය යුක්ති යාන්ත්‍රණ සංකල්ප පිළිබඳ උපදෙස් දීම ඇතුළත්ය. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම සහ සිවිල් සමාජය සමග සමීපයෙන් වැඩ කරන අතර එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ අරමුදල යටතේ වැඩ සටහන් පිළිබඳ ක්‍රියාකාරකම් ගොඩ නැගීමේ දී නේවාසික සම්බන්ධීකාරක සහ රටතුළ සිටින එක්සත් ජාතීන්ගේ කණ්ඩායම සමග සම්පූර්ණයෙන්ම සම්බන්ධවී සිටී.

7. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය ඇතුළත් දේශපාලන පක්ෂ ගණනාවක පුළුල් එකතුවකින් 2015 සැප්තැම්බර් මස පිහිටුවා ගත් ජාතික එක්සත් ආණ්ඩුව තම තත්වය ස්ථාවර කර ගෙන ඇති නිසා ප්‍රතිසංස්කරණ සඳහා හිතකර දේශපාලන පරිසරයක් නිර්මාණය කර ඇත. එහෙත් පාලන ප්‍රතිසංස්කරණ, සංක්‍රාමීය යුක්තිය සහ ආර්ථිකය යළි නගා සිටුවීමේ ප්‍රතිසංස්කරණ පිළිබඳ සම්පූර්ණ

---

[3] http://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=16771&Lang=E

[4] http://www.ohchr.org/en/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=17029&LangIE

[5] http://www.ohchr.org/en/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=19943*LangID=E
http://www.ohchr.org/en/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=19942&LangIE

[6] 2016 අගොස්තු මස ශ්‍රී ලංකාව CERD විසින් ( 10 සිට 17 දක්වා වාරික වාර්තා ඒකාබද්ධව) සැප්තැම්බර් මස CMW ( 2 වැනි වාරික වාර්තාවද), නොවැම්බර් මස CAT (5 වැනි වාරික වාර්තාවද) පුනරීක්ෂණය කරුනු ඇක. ශ්‍රී ලංකාව 2017 පෙබරවාරි මස CEDAW විසින් (8 වැනි වාරික වාර්තාව) පුනරීක්ෂණය කරනු ඇත.

පොරොන්දුව ඉටු කළ යුතුව ඇති අතර ඒවා අත්හිටුවීමේ හෝ දුර්වලවීමේ අනතුර පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අවශ්‍ය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බහුතරය ඇති කර ගැනීම සහ පවත්වා ගැනීමට ආණ්ඩුව උත්සාහ ගැනීමේ දී සභාගය තුළ පක්ෂ දේශපාලන සාකච්ඡා සහ බලය බෙදා ගැනිම සංකීර්ණ කටයුත්තක් බව පෙනේ. මෙය එකිනෙක සමග ගැටෙන අමාත්‍යාංශ බල අධිකාරිය සහිත පුළුල් කැබිනට් මණ්ඩලයෙන් සහ වගවීම වැනි අතිශය වැදගත් කරුනු පිළිබඳ සැක මුසු පණිවුඩවලින් පැහැදිලි වේ.

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව සැලකිය යුතු ප්‍රවේගයක් අත් කර ගෙන ඇත. 2016 අවසන් වන විට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හෝ සංශෝධන කෙටුම්පත් කිරීම සඳහා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පිහිටුවීමේ යෝජනාවක් 2016 මාර්තු 10 වැනි දින පාර්ලිමේන්තුව සම්මත කළාය. එය 2017 දී ජනමත විචාරණයකට ඉදිරිපත් කරනු ඇත. තමන් වෙත ලැබුණ මහජන අදහස් ඉදිරිපත් කිරීම්වලින් සහ 2016 මුල් කාර්තුවේ දී දිස්ත්‍රික් මට්ටමේ උපදේශන පැවැත් වූ මහජන අදහස් විමසීමේ කමිටුවකින් සිදු කළ සියල්ලන් ඇතුළත් කර ගන්නා උපදේශන ක්‍රියාවලියකින් කෙටුම්පත් කිරීම පෝෂණය විය.

9. මානව අයිතිවාසිකම් දෘෂ්ටිකෝණයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය අතීතයේ වූ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට සහ අවභාවිතයට දායක වූ ව්‍යුහාත්මක ඌනතා නිවැරදි කිරීමට හා නැවත ඇති නොවීමේ සහතිකය තහවුරු කිරීමට ඉතා වැදගත් අවස්ථාවක් සලසයි. ඒවාට වඩාත් සවිස්තරාත්මක අයිතිවාසිකම් පනතක්, ශක්තිමත් ආයතනික සංවරණ සහ තුලන, ප්‍රබල ව්‍යවස්ථා පුනරීක්ෂණ, අධිකරණයේ ස්වාධීනත්වය සඳහා වඩාත් බලවත් සහතික, පුද්ගල පැමිණිලි ප්‍රබල යාන්ත්‍රණ සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ගිවිසුම් වඩාත් ශක්තිමත්ව සෘජුවම ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇතුළත් විය හැකිය. එමෙන්ම සාමාන්‍ය ජනතාව විසින් හමුදාව ගැන කෙරෙන සොයා බැලීම් අනෙකුත් රටවල අත්දැකීම්වලින් පෙන්නුම් කරන ආකාරයට ආරක්ෂක ප්‍රතිපත්තිය, විනය සහ උසස්වීම්, අයවැය සහ මිලදී ගැනිම් පිළිබඳ අතපසුවීම් සහ වගවීම් විවිධාකාරයෙන් ශක්තිමත් කිරීමද ඇතුළත් කළ හැකිය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආණ්ඩුව අදහස් කරන සංක්‍රාමිය යුක්ති යාන්ත්‍රණ පිහිටුවිම, නිදසුනක් වශයෙන් අන්තර්ජාතික අපරාධ ජාතික නිතිය යටතේ අපරාධ ලෙස සැලකීම හෝ අන්තර්ජාතික අධිකරණ නිලධාරීන්ට සහභාගිවිමට අවස්ථාව සැලසීම පහසුකිරීමේ දීත් වැදගත් ය. ඒ සමගම ව්‍යවස්ථාව වෙනස් කිරීමේ දේශපාලන ක්‍රියාවලියේ දී වගවීම, සංක්‍රාමිය යුක්තිය හා මානව අයිතිවාසිකම් පිලිබඳ කේන්ද්‍රීය කරුණු ගැන ගනුදෙනු සහ සම්මුතින් සිදු නොවනු ඇතැයි මහ කොමසාරිස් අපේක්ෂා කරයි.

10. ආණ්ඩුවේ ව්‍යවස්ථා සංශෝධනයේ පළමු වටයේ මුල්ම ජයග්‍රහණයක් වූයේ 2015 අප්‍රේල් මස 19 වැනි සංශෝධනයෙන් අධිකරණයේ ජ්‍යෙෂ්ඨ තනතුරුවලට සහ මූලික ස්වාධීන ආයතනවලට පත්වීම් නිර්දේශ කිරීම සඳහා ව්‍යවස්ථා සභාව ප්‍රතිස්ථාපනය කිරීම ය. මේ අනුව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමට කීර්තිමත් සාමාජිකයන් පත් කිරීමට හැකි විය. මානව හිමිකම් කොමිසමේ සම්පත් සහ කාර්ය මණ්ඩලය වඩාත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවයක් පවතින නමුත් නීති කෙටුම් පත් කිරීම සහ මරණ දඬුවම, පොලිස් අපහරණ, රඳවා ගැනිම් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රසිද්ධ ප්‍රකාශන සහ මැදිහත්වීම් වලින් දැනටමත් ඵලදායී තත්වයක් පෙන්නුම් කර ඇත. ආණ්ඩුවේ අනෙකුත් ආයතන මෙම වැදගත් ආයතනයට වඩාත් වැඩි සහයෝගිතාවයක් සහ ගරුත්වයක් ලබා දෙනු ඇතැයි ද, සංක්‍රාමීය යුක්තිය සහ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියේ සියලු ලක්ෂණවලදී එය මුළුමනින්ම සහභාගි කර ගනු ඇතැයිද මහ කොමසාරිස් අපේක්ෂා කරයි.

11. ආණ්ඩුව ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහාත් බහුතරවාදී දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම සඳහාත් සංකේතාමකව වැදගත් සමහර පියවර ගනිමින් සිටී. 2015 නොවැම්බර් මාසයේ දී ආණ්ඩුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ තහනම් කර තිබූ දෙමළ ඩයස්පෝරා සංවිධාන සහ පුද්ගලයන් ගණනාවක් එම ලැයිස්තුවලින් ඉවත් කෙළේය. 1950 මුල්ම කාලයෙන් පසුව 2016 පෙබරවාරි මස නිදහස් දිනයේ දී ජාතික ගීතය සිංහල සහ දෙමළ බසින් ගායනා කිරීමට තීරණය කිරීම සහ පසුවදා ඊට ප්‍රතිචාරයක් වශයෙන් උතුරු පළාතේ දෙමළ ජාතික මහ ඇමති යාපනයේ බෞද්ධ පන්සලකට යෑමත් බලවත්

හැඟවීමක් ලබා දෙන්නකි. 2009 ජයග්‍රහණය උත්කර්ෂවත් ලෙස සැමරීමේ කලින් පැවති හමුදා උත්සවය වෙනුවට 2016 මැයි 19 වැනිදා චාම් සිහිපත් කිරීමේ දිනයක් පැවැත්විණ. ජනාධිපති සිරිසේන සහ අගමැති වික්‍රමසිංහ යුද්ධයෙන් පීඩාවට පත් සහ අවතැන් වූ ජනතාව බැලීමට ගිය අතර ජනාධිපතිවරයා වරක් තමා ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් දඬුවම් ලැබ සිටි එල්ටීටීඊ සිරකරුවෙකු නිදහස් කෙළේය.

12. මෙවැනි නිර්භීත සහ කැපී පෙනෙන පියවර විශ්වාසය සහ බැඳීම ඇති කිරීමේ වාතාවරණයක් නිර්මාණය කිරීමට ප්‍රබල බලපෑමක් ඇති කරන නමුත් ඒ සමග වඩාත් වැඩි ආයතනික වෙනස්කම් සිදුවිය යුතු බව මහ කොමසාරිස් විශ්වාස කරයි. ඒ සමගම සමාජ මාධ්‍යයෙන් සහ අනෙකුත් ආකාරයෙන් වාර්ගික, ආගමික සහ වෙනත් සුළුතරයන්ට එරෙහිව ( සිංහ ලේ  ස්ටිකර් වාහනවල ඇලවීමේ ව්‍යාපාර වැනි) ජාතිවාදය අවුස්සන ප්‍රචාරක ව්‍යාපාර දිගටම පැවතීම ගැන ඔහු කනස්සල්ලට පත්වේ. පසුගිය මාසවල මුස්ලිම් ප්‍රජාව, ඉවැන්ජලික නිකායේ ක්‍රිස්තියානින් සහ සමලිංගික/සංක්‍රාන්ති ලිංගික කණ්ඩායම් (LGBT ) ඉලක්ක කර ගත් සිද්ධීන් දිගටම වාර්තා විය. වෛරී කතාව සහ ප්‍රචණ්ඩත්වයට උසි ගැන්වීම පාලනය කිරීමට ආණ්ඩුව විසින් සුදුසු ව්‍යවස්ථා පැනවීම ඇතුළත් මෙවැනි වෙනස් කොට සැලකීමේ ප්‍රචණ්ඩත්වය සෘජුවම මර්දනය කිරීම මහ කොමසාරිස් දිරිමත් කරයි.

13. රජය වින්දිතයන් සහ සුළුතර ප්‍රජාවන් තුළ විශ්වාසය ගොඩ නැගීමට ඉවහල්වන වෙනත් නිශ්චිත පියවර ගැනීමට ප්‍රමාණවත් කඩිනමකින් ඉදිරිපත්ව නැත. ආණ්ඩුව 2015 දී උතුර සහ නැගෙනහිර මෙතෙක් හමුදාව භාරයේ පැවති සිවිල් ජනතාවගේ ඉඩම් හඳුනාගෙන නිදහස් කිරීමේ මූලික ප්‍රගතියක් අත්කර ගත්තේය. ඒ අනුව ඉඩම් අක්කර 3,136 ක් පවුල් 2200 අතර බෙදා දී ඇත. 2016 දී සන්නද්ධ හමුදා වැඩි වශයෙන් යාපනය සහ මන්නාරම ප්‍රදේශවල, තවත් ඉඩම් අක්කර 2,652 ක් ආපසු භාර දී ඇතැයි වාර්තාවේ. ඉඩම් නිදහස් කිරීමේ දී සහ හමුදාවෙන් ඉදි කර ඇති ව්‍යුහයන් නැවත පිහිටුවීමේ දී මතුව ඇති සමහර සංකීර්ණතා මහ කොමසාරිස්ට ඔහුගේ සංචාරයේ දී ඉදිරිපත් වූ නමුත් අලුතින් පිහිටුවා ඇති කාර්ය සාධක බලකායෙන් මෙම ක්‍රියාවලිය ජූනි වන විට අවසන් කිරීමට අපේක්ෂා කරන බවට සහතික විය. එතැන් සිට ප්‍රගතියක් වාර්තාවී නැති අතර සිවිල් නායකයන් සහ නිලධාරීන් හමුදාවේ සහයෝගය ලබා ගැනීමට උත්සාහ කරන බව පෙනේ. හමුදාව වගා කිරීම් සහ සංචාරක ව්‍යාපාරය වැනි වානිජ ක්‍රියාකාරකම්වල දිගටම නිරතව සිටින බව ද වාර්තාවේ. විවෘත භාවයක් සහ තොරතුරු නොමැතිවීම නිසා කලකිරීම සහ මුළාවීම් වඩාත් වැඩිවන බව යාපනයේ අවතැන් වූ ප්‍රජාව බැලීමට ගිය අවස්ථාවේ දි මහ කොමසාරිස්ට නිරීක්ෂණය කළ හැකි විය. යාපනයේ සරණාගත කඳවුරක නිවැසියෙකු ඔහුට පැවසූ ආකාරයට ''අපට දැන් යහපාලනයක් තියෙනවා. ඒත් අපිට ගෙදර යන්න ඕනෑ''

14. ත්‍රස්තවාදී පනත යටතේ ආරක්ෂක හේතූන් මත රඳවා ගෙන ඇති රැඳවියන් බලවත් කනස්සල්ලට කරුණකි. 2015 දෙසැම්බර් මස ආණ්ඩුව චෝදනා නැතිව රඳවා ගෙන සිටි පුද්ගලයන් 39 ක් ඇප මත නිදහස් කළ නමුත් තවත් 250 කට ආසන්න රැඳවියන් සංඛ්‍යාවක් සිටින්නේයැයි විශ්වාස කෙරේ. මෙම පුද්ගලයන්ගෙන් 117 කට ආණ්ඩුව අභිචෝදනා ඉදිරිපත් කර ඇති අතර නඩු විභාග කඩිනම් කිරීම සඳහා ජනවාරි මස විශේෂ මහාධිකරණයක් පිහිටුවන ලදී. මාර්තු අග වනවිට නීතිපති කාර්යාලයෙන් තීරණ ලබා දෙනු ඇතැයි ආණ්ඩුව පොරොන්දු වුවද මෙම වසරේ මෙතෙක් තවදුරටත් චෝදනා ඉදිරිපත් කිරීම හෝ නිදහස් කිරීම සිදුව නැත. මෙම තත්වය අදාල පුද්ගලයන්ට හා ඔවුන්ගේ පවුල්වලට – ඔවුන්ගෙන් සමහරු උපවාස කිරීමට ද ඉදිරිපත් වූහ. - දැඩි චිත්ත වේදනාවක් ගෙන දෙන්නක් පමණක් නොව පොදුවේ දෙමළ දේශපාලන පක්ෂ සහ ප්‍රජාව අතර අපේක්ෂා භංගත්වය වැඩිවීමටත් හේතුවක් වී ඇත. මහ කොමසාරිස් 2016 පෙබරවාරියේ සිය සංචාරයේ අවසන ආරක්ෂක හේතු මත රඳවා ඇති ඉතිරි රැඳවියන්ට චෝදනා ඉදිරිපත් කිරීමට හෝ නිදහස් කිරීමට ඉක්මණින් ක්‍රියාමාර්ගයක් සකස් කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේය.

15. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කිරීමට ආණ්ඩුව පොරොන්දු වුවද අලුතින් අත් අඩංගුවට ගැනීම සඳහා එම නීතිය යොදා ගැනීමෙන් තත්වය වඩාත් සංකීර්ණ වී ඇත. ලැබී ඇති වාර්තා අනුව 2015 – 16

කාල සීමාවේ දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නව අත් අඩංගුවට ගැනීම් 40 කට වඩා සිදු කර ඇති අතර යාපනයේ දී පුපුරන ද්‍රව්‍ය තොගයක් අත් අඩංගුවට ගැනීමෙන් පසුව 2016 මාර්තු - අප්‍රේල් කාලයේ සිදු කළ ආරක්ෂක මෙහෙයුම්වලින් අත් අඩංගුවට ගත් 25 කට වඩා වැඩි සංඛ්‍යාවද ඊට ඇතුළත් ය. වාර්තාවී ඇති ආකාරයට මෙම අත් අඩංගුවට ගැනීම් සමහරක් සිදුව ඇත්තේ හිතුමතයට සහ නිසි නීති ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමකින් තොරව නිසා ඉන් සමහරක් අතීතයේ සිදු වූ කුප්‍රකට ''සුදු වෑන්'' වලින් සිදු කළ පැහැර ගැනීම්/අතුරුදහන් කිරීම් හා සැසැඳිය හැකිය. පැහැදිලි වෙනස්කම් පවතින නමුත් ( අත් අඩංගුවට ගත් සියලු දෙනා පැය කිපයකට පසු රඳවා ගැනීම යටතේ නැවත ඉදිරිපත් කර ඇත) මෙවැනි සිද්ධීන් නිසා ප්‍රජාව තුළ භීතිය ඇති කරවන අතර නීතිය සහ අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව නීතියේ ආධිපත්‍යය සහ අපරාධ නීති ක්‍රියා පටිපාටි ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වූ රජයේ ප්‍රයත්නය කෙරේ විශ්වාසය පළුදු කරවයි. වධහිංසා පැමිණවීම් පිළිබඳ විශේෂ වාර්තාකරු ඔහුගේ සංචාරයේ අවසානයේ දී අතීතයේ සිදු වූවාට වඩා අඩු ප්‍රමාණයකින් සහ තීව්‍රතාවයකින් වුවද ආරක්ෂක හේතූන් මත රඳවා ගෙන ඇති පුද්ගලයන්ට වධ හිංසා පැමිණවීම් සහ අකාරුණිකවීම් පිළිබඳ චෝදනා ඉදිරිපත් වන බව ඉස්මතු කරයි. සමහර කණ්ඩායම් එල්ටීටීඊ සම්බන්ධතා ඇතැයි සැක කරන දෙමළ ජාතිකයන් ආපසු ශ්‍රී ලංකාවට පැමිණීමේ දී වධ හිංසා සහ ලිංගික අපයෝජනවලට ලක්වීමේ සිද්ධීන් පිළිබඳව වාර්තා කර ඇත.

16. දිගටම පවතින මෙම අවධානයෙන් හමුදා සහ බුද්ධි ආයතන පිළිබඳව පූර්ණ සිවිල් පාලනයක් ඇති කිරීමේදිත් අතීතයේ සිදු වූ බරපතළ උල්ලංඝනය කිරීම් පිළිබඳ වගකීම් පැවරෙන ඒකක සහ ව්‍යුහයන් ඉවත් කිරීමේදීත් ආණ්ඩුවට ගැඹුරු අභියෝගවලට මුහුණ දීමට සිදුවන බව පෙන්නුම් කරයි. මුර කපොළු ඉවත් කිරීම වැනි නිරායුදකරණය සඳහා පිළිගත හැකි පියවර ගෙන තිබෙන නමුත් උතුරේ සහ නැගෙනහිර හමුදාව විශාල වශයෙන් සහ සෝදිසියෙන් සිටීම බරපතළ කරුණක්ව පවතී. සමහර අවස්ථාවල බියවැද්දීම සහ හිරිහැර කිරීම් ද පවතී. පුනරුත්ථාපනය කිරීමෙන් පසුව නිදහස් කරන ලද හිටපු රැඳවියන් සහ වින්දිතයන් සමග වැඩ කරන සිවිල් සමාජ කණ්ඩායම් නිතිපතා ආරක්ෂක පරික්ෂාවන්ට සහ තම වැඩ කටයුතු ගැන ප්‍රශ්න කිරීම්වලට ලක් වේ.

17. මේ අතර ආණ්ඩුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට නව ආරක්ෂක නීති කෙටුම්පත් කරමින් සිටී. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් යාන්ත්‍රණය කලින් කරන ලද බොහෝ වූ නිරීක්ෂණ සැලකිල්ලට ගනු ඇතැයි අපේක්ෂා කරන මහ කොමසාරිස් මේ සම්බන්ධයෙන් තම කාර්යාලයේ සහාය සහ සම්බන්ධතාවය ලබා දීමට සූදානම් ය. මානව හිමිකම් කොමිසම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීමේ දී තිබිය යුතු ආරක්ෂාවන්යැයි සැලකෙන මගපෙන්වීම් මෑතකදී නැවත නිකුත් කර ඇත. ජුනි 17 වැනි දා ජනාධිපතිවරයා විසින් ද මානව හිමිකම් කොමිසමට සිය බලතල, කාර්යන් සහ යුතුකම් යොදා ගැනීමට හා ඉටු කිරීමට හැකි කරවනු සඳහාත් අත් අඩංගුවට ගත් හෝ රඳවා ගත් පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් ගරු කිරීම සහතික කිරීම සඳහාත් එවැනි පුද්ගලයන්ට මානුෂිකව සැලකීම සඳහාත් සන්නද්ධ සේවා අණදෙන නිලධරීන්ට සහ පොලීසියට මීට සමාන මගපෙන්වීම් නිකුත් කෙළේය. මහ කොමසාරිස් මෙම මගපෙන්වීම් සතුටින් පිළිගන්නා අතර මානව හිමිකම් කොමිසම ව්‍යවස්ථා පුනරීක්ෂණයේ දි පූර්ණව සම්බන්ධ කර ගැනිමට සහ රැඳවා තැබීමේ ස්ථාන පූර්ණව, ස්වාධීනව සහ බාධාවෙන් තොරව අධීක්ෂණය කිරීම සඳහා එහි බලතල ශක්තිමත් කරවන ලෙස ආණ්ඩුව දිරිමත් කරයි.

18. රජයට තම වගවීම පවත්වා ගැනීමේ අධිෂ්ඨානය පිළිබඳව ජනතාවගේ සහ ජාත්‍යන්තර විශ්වාසය ඉක්මණින් ගොඩ නැගිමටත් අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නිතිය යටතේ ඇති තම යුතුකම් ඉටු කිරීමටත් ඇති තවත් මාර්ගයක් වන්නේ අධිකරණයේ විභාග වෙමින් පවතින සමහර සංකේතාත්මක නඩු කීපයක හෝ අභිචෝදනා සාර්ථකව සපුරා ගැනීමයි. බලයට පත්වූ පළමු මාස කීපය ඇතුළත ප්‍රකට සිද්ධීන් ගණනාවක් පිළිබඳව, නිදසුන් වශයෙන් මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම, පුවත්පත් කර්තෘ ලසන්ත වික්‍රමතුංග මරා දැමීම, සහ දෙමළ පාර්ලිමේන්තු මංත්‍රීන් වූ ජොසප් පරරාජසිංහම් සහ නඩරාජා රවිරාජ් ඝාතන සහ රග්බි ක්‍රීඩක වසීම් තජුඩීන් මරා දැමීම පිළිබඳව ආන්දොලනාත්මක හෙළිදරව් සහ අත් අඩංගුවට ගැනීම් ගණනාවක් සිදු වුවද එතැන් සිට ප්‍රගතිය මන්දගාමී වී ඇත. සාක්ෂිකරුවන් ඉදිරිපත්

කිරීම පහසු කරවීමට ආණ්ඩුව නැවතත් ප්‍රයත්න දරා ඇති නමුත් ත්‍රිකුණාමලය සිසුන් පස්දෙනා ගේ ඝාතනය සහ ඒ.සී.එෆ්. රාජ්‍ය නොවන සේවක ඝාතනය පිළිබඳ නඩු ලඝු නඩු විභාග කිරීමේ කාර්ය පටිපාටියේ විවිධ අවධිවල පවතී.

19. 2010 වසරේ දී විශ්වමඩු හි දෙමළ ගැහැනුන් දෙදෙනෙකුට ලිංගික අතවර කිරීම සම්බන්ධයෙන් හමුදා භටයන් හතර දෙනෙකු ඔක්කෝබර් මස වරදකරුවන් වූහ. කෙසේ වුවත් එවැනි දඬුවම් නියම කිරීම් විරලය. මහ කොමසාරිස් තම ශ්‍රී ලංකා සංචාරයේ දී ආණ්ඩුව 2014 දී මානව අයිතිවාසිකම් කොමිටියට දැනුම් දුන් හමුදාව සම්බන්ධ ලිංගික අතවර 39 ක් පිළිබඳ ප්‍රගතිය යාවත්කාලීන කරන ලෙස ඉල්ලා සිටියේය. 2016 ජනවාරි මස පොලිසිය විසින් හෝමාගම මහෙස්ත්‍රාත් උසාවියේ දී ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳට තර්ජනය කළ සහ අධිකරණයේ පැවැත්වෙන නඩු විභාගයට බාධා කළ දැඩි මතධාරී බෞද්ධ නායකයන් උසාවියට අපහාස කිරීම නිසා අත් අඩංගුවට ගන්නා ලදී. ටීඇම්වීපී/කරුණා කණ්ඩායමේ අතුරු හමුදා නායකයෙකු වන පිල්ලෙයාන්, පරරාජසිංහම් නඩුව සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාරයේ සිටී. මිනී මැරීම්, පැහැරගෙන යෑම් සහ ළමා සොල්දාදුවන් විශාල වශයෙන් බඳවා ගැනීම් පිළිබඳ වගකිවයුතුයැයි කියන අනෙකුත් අතුරු හමුදා නායකයන් තවමත් රජයේ තනතුරුවල සිටින අතර ඔවුනට එරෙහිව අපරාධ විමර්ශන සිදුවන්නේ නැත. දැනට පවතින නඩු සංක්‍රාමීය යුක්තිය පිළිබඳ නව යාන්ත්‍රණයන් ගොඩ නගන තෙක් පසකට නොදමා කඩිනම් කළ යුතුයැයි මහ කොමසාරිස් දැඩිව නිර්දේශ කරයි.

20. වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් ක්‍රම පද්ධතියක් නොමැතිවීම ප්‍රධාන බාධකයක්ව පවතී. නව ආණ්ඩුව 2015 පෙබරවාරි මස දිගු කලක් තිස්සේ පැවති නීතියක් සම්මත කර ගත් නමුත් මහ කොමසාරිස් කලින් වාර්තාවලින් ඉස්මතු කර දක් වූ අඩුපාඩු මෙම ව්‍යවස්ථාවේ පවතී. 30/1 යෝජනාව අනුව මෙම ව්‍යවස්ථාව තව දුරටත් පුනරීක්ෂණය කිරීමට ආණ්ඩුව බැඳී සිටින නමුත් එය තවම සිදුව නැත. මේ අතරතුර 2016 ජනවාරි සිට මෙම නීතිය යටතේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය පත් කර ඇති නමුත් එහි පළමු සභාපති ඉවත්ව ගිය අතර ඉන් පසු එම තනතුරුට පත් තැනැත්තා විදේශ තනතුරකට පත් කර ඇත. ඒ වෙනුවට වෙනත් කෙනෙකු පත් කර නැත. පැහැදිලිවම අන්තර්ජාතික අපරාධ පිළිබඳ කාර්යන් සඳහා ගැලපෙන සහ ජනතා විශ්වාසය පවත්වා ගන්නා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ප්‍රබල පද්ධතියක් ශක්තිමත් කිරීම, සාක්ෂිකරුවන්ට විශ්වාසයක් ඇතිව ඉදිරිපත්වීමට හා සංක්‍රාමීය යුක්ති යාන්ත්‍රණ විශ්වාසදායකයැයි සැලකීමට පෙර අත්‍යවශ්‍ය වූ කරුණකි.

21. අන්තර්ජාතික ප්‍රමිතීන්ට ගැලපෙන ආකාරයට අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ස්වාධීනත්වය සහ කාර්යක්ෂමතාවය සඳහා වඩාත් හොඳ ආරක්ෂා විධි විධාන ඇතුළත් කිරීමට 2015 අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහායදීම සහ ආරක්ෂා කිරීම සඳහා වූ පනත පුනරීක්ෂණය සහ සංශෝධනය කරන ලෙස මහ කොමසාරිස් ආණ්ඩුවෙන් දැඩිව ඉල්ලා සිටී.

22. 30/1 යෝජනාවෙන් ආණ්ඩුව නඩු පැවරීමේ මුලපිරුම්, සත්‍යය සෙවීම, හානි පූරණ වැඩ සටහන්, සහ ආයතනික සංශෝධන ඇතුළත් විය යුතු අධිකරණ සහ අධිකරණ නොවන පුළුල් ක්ෂේත්‍රයක පියවර ගණනාවක් අන්තර්ග්‍රහණය කෙරෙන සවිස්තරාත්මක සංක්‍රාමීය යුක්ති න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කිරීමේ තම කැපවීම දක්වා ඇත. ආණ්ඩුව සූදානම් කිරීමේ ක්‍රියාවලීන් ගණනාවක නිරතව සිටින නමුත් විවිධ වූ සංක්‍රාමීය යුක්ති අංගෝපාංගයන් සැලසුම් කිරීම සහ ස්ථාපනය කිරීමට ඉඩ සැලසෙන ව්‍යුහයන් පිහිටුවීමේ සමස්ත ප්‍රගතිය මන්දගාමී සහ දෙගිඩියාවෙන් යුතුය.

23. නොයෙකුත් අමාත්‍යාංශ සහ ආයතන අතර බලතල බෙදීමේ නිරවුල් භාවයක් නොමැතිවීමෙන් පවතින වගකීම්වල අපැහැදිලිතාවය නිසා ප්‍රගතියක් අත්කර ගැනීමට බාධාවී ඇත. වැඩි දුරටත් සමස්ත සංක්‍රාමීය යුක්ති උපාය මාර්ගයක් නොමැතිවීමෙන් විවිධ සංක්‍රාමීය යුක්ති යාන්ත්‍රණ එකට එක් වන්නේ කෙසේද යන්න ගැන ප්‍රශ්න මතු කරයි. අදාල වන විවිධ අමාත්‍යාංශ අතර සමස්ත දේශපාලන සම්බන්ධීකරණය ඇති කිරීම සඳහා 2015 නොවැම්බර් මස අගමැතිවරයාගේ ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවා ඇත. ඒ සඳහාම වෙන් වූ ප්‍රතිසන්ධාන යාන්ත්‍රණ සම්බන්ධීකරණය සඳහා වූ මහ ලේකම් කාර්යාලයෙන් ( SCRM ) ඊට

සහාය ලැබෙන අතර ඒ සඳහා මෑතකදී මහ ලේකම්වරයෙකු පත් කිරීම සතුටට කරුණකි. එසේ වුවත් ආයතනික හැකියාවෙන් සහ ඒ සඳහාම වූ විශේෂඥතාවයෙන් තව දුරටත් එය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

24. 30/1 යෝජනාවේ දැක්වෙන තීරණාත්මක පළමු පියවරක් වන්නේ මෙම යාන්ත්‍රණ සහ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී වින්දිතයන් සහ සම්ප්‍රදායිකව බැහැර කළ අයගේ සහභාගිත්වය සහතික කිරීමට පුළුල් ජාතික උපදේශනයක් පැවැත්වීම කේන්ද්‍රීය කරුණක් කර ගැනීමය. වඩාත් වැදගත්ව සංක්‍රාමීය යුක්ති යාන්ත්‍රණවලට ගැටුම්වලට අදාල උල්ලංඝනය කිරීම් වෙනුවෙන් ස්ත්‍රීන්ට ප්‍රමාණවත් සහන ලැබෙන බවත්, මෙම ක්‍රියාවලීන් තුළ පූර්ණව සහභාගි විය හැකි බවත් තහවුරු කරන විශේෂ පියවර සැලසිය යුතුය. උපදේශනයට ලක් වන ජනතාවට දැනුවත්ව අදහස් ප්‍රකාශ කිරීමට හැකි කරවනු සඳහා අවශ්‍ය තොරතුරු සහ අවබෝධය ලබා දිය යුතු නිසා එක් එක් අය සඳහා ගැලපෙන සංවේදී කරවීමේ වැඩ සටහන් උපදේශන සමග බැඳී තිබීම අවශ්‍ය ය. මේ සම්බන්ධයෙන් විශ්වාසය ගොඩ නැගීමේ පියවර සහ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ඉදිරිපත්වීමට පැහැදිලි ආයතනික ආරක්ෂක විධි විධාන අතිශයෙන් වැදගත් ය.

25. 2016 ජනවාරි මස ආණ්ඩුව ජාතික උපදේශන ක්‍රියාවලියක් පැවැත්වීමට බලය පවරන ලද සිවිල් සමාජයේ ප්‍රමුඛ සාමාජිකයන්ගෙන් සැදුම් ලත් සාමාජිකයන් 11 කින් යුත් කාර්ය සාධක බලකායක් පත් කරන ලදී. ලිඛිත සැල කිරීම් ලබා ගැනීමට යාන්ත්‍රණයක් පිහිටුවීමෙන් මෙම කාර්ය සාධක බලකාය පෙබරවාරි මස අන්තර්ජාලය හරහා උපදේශන ලබා ගැනීම ආරම්භ කෙළේය. ඉලක්ක කර ගත් කණ්ඩායම් සාකච්ඡා සහ අදාල පාර්ශ්වකරුවන් සමග ඍජු උපදේශන ජුනි මාසයේ දී ආරම්භ කරන ලද අතර එය පළාත් සහ දිස්ත්‍රික් මට්ටම් දක්වා ව්‍යාප්ත කරනු ඇත. මෙම උපදේශන ක්‍රියාවලියේ දී නොයෙකුත් ජන කොටස් ඍජුවම අදහස් හුවමාරු කර ගැනීමේ නව අවධියකට එළඹෙන නිසා උපදේශනයට සහභාගිවන අය හිරිහැර හෝ තර්ජනය කිරීම්වලට ලක් නොවීම වැදගත් ය. විදේශවල සිටින වින්දිතයන් ඇතුළත් කර ගැනීමේ අවශ්‍යතාවය දකින මහ කොමසාරිස් ඩයස්පෝරාව තවදුරටත් සම්බන්ධකර ගැනීම අවධාරණය කරයි.

26. මීට සමාන්තරව 2016 මැයි මස ආණ්ඩුව ප්‍රමුඛතාවයක් ලබා දුන් යෝජිත අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්බන්ධයෙන් වේගවත් උපදේශන ක්‍රියාවලියක් පවත්වන ලදී. වෙනස් ස්වභාවයකින් සහ සම්පත් වඩාත් ආයෝජනය කිරීමෙන් වුවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සමාන්තර උපදේශනයක් සාර්ථකව පැවැත්වීමෙන් ශ්‍රී ලංකාවට කාර්යක්ෂමව සහ සාමකාමීව එවැනි සංකීර්ණ ක්‍රියාවලියකට පිවිසිය හැකිවීම ගැන බලාපොරොත්තු ඇති කරවයි.

27. ඒ සමගම ආණ්ඩුව දැනටමත් සම්බන්ධීකරණයක් හෝ විවෘත භාවයක් නොමැතිව සංක්‍රාමීය යුක්ති යාන්ත්‍රණ සඳහා විවිධ ආදර්ශයන් සැලසුම් කිරීමට නොයෙකුත් මට්ටමෙන් වැඩ කරන විවිධ උපදේශකයන් සහ විශේෂඥයන් පත් කර ඇත. මෙවැනි මූලික වැඩ කොටස් අවශ්‍ය වන නමුත් ඉන් උපදේශන ක්‍රියාවලියේ ප්‍රතිඵල කලින්ම අත් කර ගැනීමක් සහ ඒවා අර්ථ ශූන්‍ය බවට පත් කිරීමක් නොවීම වැදගත් ය. පුද්ගල, විශේෂඥ වැඩ තිරය පිටුපස සිදුවන අතර ක්‍රියාවලියේ සහභාගිත්ව පැතිමාන ජනතාව සමග වඩාත් හොඳින් සම්බන්ධවීමේ අවශ්‍යතාවයක් පවතී.

28. මෙම නොසන්සුන්කම අතුරුදහන් තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් (OMP ) පිහිටුවීමට ව්‍යවස්ථාව සකස් කිරීමේ දී දක්නට ලැබිණ. අතුරුදහන්වීම් ගැන කටයුතු කිරීම හදිසි අවශ්‍යතාවයක් වන අතර එය වින්දිතයන් සහ පීඩාවට පත් ප්‍රජාවන් අතර බැඳීමක් සහ විශ්වාසයක් ඇති කළ යුතුය. ඒ අනුව ආණ්ඩුව එහි වැඩ කටයුතුවලට ප්‍රමුඛතාවයක් ලබා දීම නිවැරදිය. යෝජිත කාර්යාලය වින්දිතයන්ට අවශ්‍ය කරන නෛතික, පරිපාලන හෝ මානසික සේවාවන් ලබා ගත හැකි සහ තම අතුරුදහන් වූ ඥාතීන්ගේ ඉරණම පැහැදිලි කර දීමට අදහස් කළ ස්ථිර ව්‍යුහයකි.

29. ආණ්ඩුවේ උපදේශකයන්ගේ ක්‍රියාකාරී කණ්ඩායමක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීමට ව්‍යවස්ථා කෙටුම් පතක් සකස් කර ඇත. කෙසේ වුවත් එම කෙටුම් පත ප්‍රසිද්ධ කර සාකච්ඡාවට ලක් කර නැත. කෙටුම් පත පිළිබඳ මහජන සංවාදය සීමිතවීම ගැන වින්දිතයන් සහ සිවිල් සමාජය කනස්සල්ල ප්‍රකාශ කළ විට වින්දිතයන් සහ උපදේශන කාර්ය සාධක බලකාය සමග රැස්වීම් පැවැත්වීම ඇතුළුව අදාල පාර්ශ්වකරුවන්ගේ සැල කිරීම් ඇතුළත් කිරීමට ප්‍රමාද වී ගත් උත්සාහයක් විය. මෙම ව්‍යවස්ථා කෙටුම්පත මැයි මස අගදී කැබිනට් මණ්ඩලයෙන් අනුමත කිරීමෙන් පසුව ජුනි 22 වැනි දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

30. වඩාත් පුළුල්ව ආණ්ඩුව අතුරුදහන්වීම් පිළිබඳ සම්මුතිය (CED ) 2015 දෙසැම්බර් මස අත්සන් කොට 2016 මැයි මස වන විට අපරානුමත කිරීම සම්පූර්ණ කරන ලදී. එය ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථා සකස් වෙමින් පවතින අතර ඊට සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවට ඇති බැඳීම් අනුව බලහත්කාරයෙන් සිදු කරන අතුරුදහන් කිරීම් දණ්ඩ නීති සංග්‍රහයේ අපරාධ ලෙස සැලකෙන ව්‍යවස්ථා ඇතුළත් වනු ඇතැයි මහ කොමසාරිස් අපේක්ෂා කරයි. ජුනි 7 වැනි දා කැබිනට් ඇමති මණ්ඩලය නොමැති බවට වූ සහතිකයක් ( Certificate of Absence ) නිකුත් කිරීමට හැකි වන කෙටුම්පත් ව්‍යවස්ථාවක් අනුමත කර ඇත. කෙටුම්පත් ව්‍යවස්ථාව ගැසට් කර ඇති අතර කෙටි කලකින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත. අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ජනාධිපති කොමිසමේ දෙවන වාර්තාව ඔක්තෝබර් මස පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අතර කොමිසමේ විභාග දිගටම පැවැත්වේ. එහෙත් අපරාධය සිදු කළ ඇත්තේ ආණ්ඩුවෙන් බව කොමිසම විසින් හඳුනාගත් සිද්ධීන් ගණනාවක් ඇතුළුව තවදුරටත් සිදු කෙරෙන අපරාධ විමර්ශන පිළිබඳ තොරතුරු මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයට ලැබී නැත.

31. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල කෙටුම්පත සකස් කළ විශේෂඥ කණ්ඩායම සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිසම සහ විශේෂ අධිකරණය වැනි විවිධ සංක්‍රාමීය යුක්ති ආදර්ශ සංකල්ප ගැනද කටයුතු සමහරවිට කරනු ඇත. කෙසේ වුවත් මෙම ලේඛන අන් අය සමග හුවමාරු කරගෙන නැත. මෙවැනි මූලික වැඩ කොටස් අවශ්‍ය සහ කාලෝචිත වන අතර පාරදෘශ්‍ය භාවයක් නොමැතිවීමෙන් සමාන්තරව සිදු වන උපදේශන ක්‍රියාවලියට සහ වින්දිතයන් සම්බන්ධ කර ගැනීමට හානි කරවයි. මෙම ජාතික උපදේශන, සංක්‍රාමීය යුක්ති වැඩ සටහන් හැඩ ගැසීමේ සහ ශක්තිමත් කිරීමේ අදහසින් මානව අයිතිවාසිකම් කවුන්සලයට මා ඉදිරිපත් කළ අවසාන වාර්තාවෙන් නිර්දේශ කරන ලද සහ 30/1 යෝජනාවෙන් පිළිගත් ආකාරයට සංක්‍රාමීය යුක්ති යාන්ත්‍රණ තුළ අන්තර්ජාතික ක්‍රියාකාරීන්ගේ සහභාගිත්වය ඇතුළත්ව උපදේශනයට ලක්වන පාර්ශ්වයන්ට නිදහසේ ප්‍රකාශ කිරීමට අවකාශය සැලසෙන ප්‍රබල සහ ගරු කටයුතු සංවාදයක් විය යුතුය.

32. අධිකරණ යාන්ත්‍රණයකට අන්තර්ජාතික විනිසුරුවන්, අභිචෝදකයන්, විමර්ශකයන් සහ නීතිඥයන් සහභාගිවීම මූලික ප්‍රශ්නයක්ව පවතී. 2016 මැයි මස අගදී අගමැතිවරයා ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් විශාල කණ්ඩායමක් අමතමින් ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ යාන්ත්‍රණය තුළ අන්තර්ජාතික සහභාගිත්වයකට ඉඩක් නැති බව නැවතත් පැවසුවේයැයි වාර්තා වී ඇත. වින්දිතයන්ගේ බැඳීම දිනා ගැනීමට අවශ්‍ය විශ්වසනීයත්වය ශ්‍රී ලංකාවේ අධිකරණ ආයතන තුළ දැනට නොමැති නිසා වින්දිතයාගේ ඇසින් ක්‍රියාවලියේ ස්වාධීනත්වය සහ අපක්ෂපාතිත්වය සහතික කිරීමට වගවීමේ යාන්ත්‍රණයන් තුළ අන්තර්ජාතික සහභාගිත්වය අවශ්‍යයැයි මහ කොමසාරිස් දිගටම විශ්වාස කරයි. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශනවලින් සොයා ගත් සිදුවූයේයැයි කියන අන්තර්ජාතික අපරාධවල විශාලත්වය සහ සංකීර්ණතාවය යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ විය හැකි බව සිත් තබා ගැනීම ද වැදගත් ය.

33. ගැටුමේ අවසාන කාල සීමාවේ දී පොකුරු බෝම්බ යොදා ගත් බවට මතුවී ඇති නව සාක්ෂි පිළිබඳ මෑතක පළ වූ වාර්තා සහ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශන වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති ඒ සමාන චෝදනා අනුව ස්වාධීන සහ අපක්ෂපාත විමර්ශනයක් සිදු කළ යුතුයැයි මහ කොමසාරිස් ඉල්ලා සිටී.

34. ආණ්ඩුව ඉදිරියේ ඇති තවත් අභියෝගයක් වන්නේ '' මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් හෝ අන්තර්ජාතික මානවවාදී නීතිය අපහරණය හෝ උල්ලංඝනය කිරීම සම්බන්ධ බරපතළ අපරාධ ගැන සාධාරණ පරිපාලන ක්‍රියාවලියක් තුළින් විශ්වාසය රැඳවිය හැකි ආකාරයෙන් ඒ හා සම්බන්ධව ඇතැයි හෙළි වූ කිසිවෙකු ආරක්ෂක හමුදාව තුළ රඳවා ගැනිම හෝ බඳවා ගැනීමට කිසිම ඉඩක් නොපවතින බව'' සහතික කෙරෙන පුළුල් පරික්ෂා කිරීමේ ක්‍රියාවලියක් ඇතුළත්ව ආරක්ෂක අංශයේ සංශෝධන ක්‍රියාවලියක් ආරම්භ කරන්නේ කෙසේද යන්නයි.[7] මෙය අන්තර්ජාතික ආරක්ෂක සහයෝගිතාවය තුළ ඊට හිමි ස්ථානය නැවත අත් කර ගැනිමට සහ විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්වලට සහභාගිවීම සඳහා ශ්‍රී ලංකා සන්නද්ධ සේවාවන්ට වැදගත් ය. මාලි හි එක්සත් ජාතීන්ගේ MINUSMA සාම සාධක හමුදාවට ශ්‍රී ලංකාවේ සටන් බැටැලියනයක් (Combat convoy battalion) ලබා දිමේ අපේක්ෂාවෙන් සූදානම්වීමේ කටයුතු දැනටමත් සිදුවෙමින් පවතින නිසා එම මෙහෙයවීමට පෙර ආණ්ඩුව විසින් ස්වාධීන, සිවිල් මානව අයිතිවාසිකම් අංගයන්ගෙන් යුත් සුදුසු, පරික්ෂා කිරීමේ ක්‍රියා පටිපාටියක් සකස් කිරීම අත්‍යවශ්‍ය වනු ඇත. ඒ සඳහා ශ්‍රී ලංකාව යෙදවීමට අදහස් කරන සියලු පුද්ගලයන් සඳහා ජාතික සහ අන්තර්ජාතික මට්ටමෙන් පරික්ෂා කිරීමේ දැඩි ක්‍රියා පටිපාටි සකස් කිරීම සඳහා ආණ්ඩුව සමග එක්ව වැඩ කිරීමට එක්සත් ජාතීන් කැමැත්තේය.

## නිගමන

**35. 30/1 යෝජනාවෙන් ඉදිරිපත් කරන ලද මූලික පොරොන්දු සමහරක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය මේ දක්වා ගෙන ඇති පියවර හා සංක්‍රාමීය යුක්ති යාන්ත්‍රණ ගැන වැඩි දුරටත් පැහැදිලි කර ගැනීමට සහ සැලසුම් කිරීමට දැනට කෙරී ගෙන යන උපදේශන සහ සූදානම්වීම් ගැන මානව අයිතිවාසිකම් සභාව සමස්තයක් වශයෙන් දිරිමත් විය යුතුය. ව්‍යවස්ථා සභාව ප්‍රතිස්ථාපනය කිරීම, ස්වාධීන මානව හිමිකම් කොමිසම සහ අතුරුදහන්වීම් පිලිබඳ සම්මුතිය (CED ) අපරානුමත කිරීම අනාගතයේ උරුමයන් වන වැදගත් ජයග්‍රහණයන් ය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපනය කිරීමෙන් පසු අතුරුදහන් වුවන්ගේ පවුල්වලට අවම වශයෙන් කඩිනම් සහන සලසන ක්‍රමයක් සැකසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංක්‍රාමීය යුක්ති යාන්ත්‍රණ අතිතයේ සිදු වූ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ ඒවා නැවත සිදු නොවන බවට සහතික කිරීමට බෙහෙවින් අවශ්‍ය කරන පුළුල් ප්‍රතිචාරයක් සලසනු ඇත.**

**36. සුළුතර ප්‍රජාවගේ විශ්වාසය ගොඩ නගන ඉඩම් සහ රැඳවියන් නිදහස් කිරීම සහ ත්‍රස්තවාදි පනත සංශෝධනය කිරිම සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ නීති වැනි වෙනත් කරුණු පිළිබඳව කඩිනම් සහ ස්ථිරසාර ප්‍රගතියක් අත්කර ගත හැකිව තිබිණ. අතිතයේ පැවති දඬුවම් නොලැබ සිටීමේ තත්වයේ හැරවුම් ලක්ෂයක් සටහන් කෙරෙන සාර්ථක නඩු විභාග ඉක්මන් කිරීමෙන් මෙන්ම සංකේතාත්මක සිද්ධීන් විමර්ශනය කිරීමේ මුල් අවස්ථාවේ දී අත් කරගත් ප්‍රවේගය නොකඩවා පවත්වා ගත යුතුය. හිතුවක්කාර අත් අඩංගුවට ගැනිම්, වධ හිංසා සහ ලිංගික හිංසන මෙන්ම පොදුවේ හමුදාවෙන් සිදුවන සෝදිසිය සහ හිරිහැර කඩිනමින් විසඳිය යුතු අතර අතිතයේ වූ භාවිතා නොඉවසන බව පෙන්වීමට මෙම භාවිතා ඉවත් කරන ව්‍යුහයන් සහ ආයතනික සංස්කෘතියක් ප්‍රවර්ධනය කළ යුතුය.**

**37. 30/1 යෝජනාවේ සඳහන් පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ ආණ්ඩුවේ ප්‍රයත්නයන්ට සම්බන්ධීකරණය කරන ලද, සංයුක්ත සහ සුදුසු ආකාරයෙන් පෙළ ගසන ලද විවිධ ක්‍රියාවලීන් අනුගමනය කිරීමට හැකි කරවන සවිස්තරාත්මක උපාය මාර්ගයක් අවශ්‍ය බව මහ කොමසාරිස් විශ්වාස කරයි. එවැනි උපාය මාර්ගයක් ආණ්ඩුව තුළ දැනට පවතින සංවිධානාත්මක නොවන සම්බන්ධීකරණ වැඩ පිළිවෙළ එක්රැස් කිරීමටත් අන්තර්ජාතික ප්‍රදානක ආධාර වඩාත් හොඳින් සම්බන්ධීකරණයත් පහසු කරවනු ඇත. එය සංක්‍රාමීය යුක්ති ක්‍රියාවලිය පසුපස සිවිල් සමාජයේ බලය සහ සහභාගිත්වය මෙහෙයවන ජනතාවට තොරතුරු සැපයෙන සංයුක්ත ප්‍රචාරක ව්‍යාපාරයකින් අනුබලය ලැබිය යුතුය. මෙය විනිවිද භාවය වැඩි කරවන අතර වින්දිතයන් සහ සිවිල් සමාජය සමග දැනට සිදු කරන උපදේශන ක්‍රියාවලිය උපරිමයට පත්**

[7] A/HRC/RES/30/1, OP. 8

කල හැකි බව සහතික කෙරෙනු ඇත. එමෙන්ම සංක්‍රාමීය යුක්ති යාන්ත්‍රණ සැලසුම් කිරීමට අර්ථාන්විත යෙදවුමක් ද වනු ඇත. මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය තව දුරටත් උපදෙස් සහ තාක්ෂණ සහාය ලබා දිමට සූදානමෙන් සිටී.

38. ශ්‍රී ලංකාව පිවිස ඇති පරිණාමීය ක්‍රියාවලියට අනිවාර්යෙන්ම කලක් ගත වනු ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන, සංක්‍රාමීය යුක්තිය, ආර්ථිකය යළි නගා සිටුවීම සහ ආරක්ෂක අංශයේ සංශෝධන ගැන විවිධ මාර්ග ඔස්සේ කටයුතු කිරීම ඕනෑම ආණ්ඩුවක් උපරිමයෙන් වෙහෙසට පත් කරවනු ඇත. කෙසේ වුවත් නොයෙකුත් පැතිවලින් මෙම ක්‍රියාවලිය කෙරේ ඇති නොඉවසීම, කාංසාව සහ සීමාවීම්වලට විසඳුම් ලබාදීම සඳහා නිශ්චිත පියවර ගන්නා ලෙසත් මෙම ක්‍රියාවලිය පසුපස සියලුම ශ්‍රී ලාංකිකයන් එකතුවීමේ වැදගත්කම පුනරුච්චාරණය කරන ලෙසත් මහ කොමසාරිස් ආණ්ඩුවෙන් ඉල්ලා සිටී. මෙම ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ දී සහ සියලුම පාර්ශ්වකරුවන්ට, විශේෂයෙන්ම වින්දිත ප්‍රජාවට සහතිකයක් සහ විශ්වාසයක් ඇති කිරීමේ දී මානව අයිතිවාසිකම් සභාවේ දිරිගැන්වීම් සහ සහාය තීරණාත්මක වේ. එමනිසා මානව අයිතිවාසිකම් කවුන්සලය සමීපයෙන් සම්බන්ධව සිටිනු ඇතැයි අපේක්ෂා කරන මහ කොමසාරිස් තිස්හතර වැනි සැසියේ දී ප්‍රගතිය ගැන තවදුරටත් වාර්තා කිරීමට බලාපොරොත්තුවෙන් සිටී.